# මහ මැතිවරණය නිමා වූ විගස පළාත් පාලන ඡන්දය පැවැත්විය යුතුයි

පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි

**අනුරාධපුර අතිරේක**
**අමිල ප්‍රභාත් වනසිංහ**

ජනාධිපතිවරණයේදී පැවති එකම ගැටලුව වූයේ රාජ්‍ය බලය සහ රාජ්‍ය දේපළ අවභාවිතය පිළිබඳ ගැටලුව පමණක් බවත්, මහ මැතිවරණය පවත්වා අවසන් වූ විගස අධිකරණ නියෝග අනුව පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු බවත් පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය. ඒ මහතා මේ බව කියා සිටියේ පෙරේදා (19) අනුරාධපුරේදී මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී තවදුරටත් අදහස් දක්වමින් රෝහණ හෙට්ටිආරච්චි මහතා මෙසේද පැවසීය:

"පැවති ජනාධිපතිවරණය ඉතා සාමකාමීව පැවති බවට දේශීය මෙන්ම ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්ද සනාථ කළා. ඒ මැතිවරණයේදී පැවති එකම ගැටලුව වූයේ රාජ්‍ය බලය සහ රාජ්‍ය දේපල අවභාවිතය පිළිබඳ ගැටලුව පමණක් බවත් එය වළක්වාලමින් මහ මැතිවරණය පැවැත්වීමට හැකි වනු ඇති බව විශ්වාසය පළ කරනවා.

"මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන්ගෙන් සියයට අනූනවයක්ම පරාජයට පත් පත් වන අතර, ජයග්‍රහණය කරන හා පරාජය වන සියලු අපේක්ෂකයන් දින 21ක් ඇතුළත සිය ආදායම් හා වියදම් වාර්තා මැතිවරණ කොමසාරිස්වරයාට දිය යුතු වනවා. ඒ ආදායම් හා වියදම් වාර්තා දීමට අපොහොසත් වන පුද්ගලයන්ට ඉදිරියේදී පැවැත්වෙන පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් වීමට අවස්ථාව අහිමි වීමට හැකිය. එසේම මහමැතිවරණය සඳහාද විදේශීය නිරීක්ෂණ කණ්ඩායම් එක්වීමට නියමිතයි.

"අධිකරණ නියෝගය අනුව මහ මැතිවරණය පැවැත්වූ වහා පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු වන අතර, ඒ සම්බන්ධයෙන් නීති සම්පාදනය විය යුතුයි. සීමා නිර්ණය පිළිබඳ දේශපාලන පක්ෂ අතර පොදු එකඟතාවක් ඇති කරගත යුතුයි."